# CYBER GUARDIAN

PUBLICATION FOR YOUR ONLINE SAFETY

ISSUE 16 FEBRUARY 2026

SRI LANKA CERT|CC

Sri Lanka Computer Emergency Readiness Team


## තීරණාත්මක රාජ්‍ය ආයතන ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානයට සම්බන්ධ කෙරේ.

අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහතාගේ උපදෙස් පරිදි, තීරණාත්මක රාජ්‍ය ආයතන ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානයට (NCSOC) සම්බන්ධ කිරීමේ කැබිනට් තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේදී විශේෂ රැස්වීමක් පවත්වන ලදී.

ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍ය ඉංජිනේරු එරංග වීරරත්න සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ ලේකම් වරුණ ශ්‍රී ධනපාල මහතා විසින් මෙහෙයවන ලද මෙම රැස්වීමේදී රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා සයිබර් ආරක්ෂණ දැනුවත්භාවය ශක්තිමත් කිරීමේ සහ ව්‍යුහගත ඩිජිටල් ආරක්ෂක පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම ඉස්මතු කරන ලදී. ශ්‍රී ලංකාව ඩිජිටල් ආර්ථිකයක් කරා ඉදිරියට යන විට, සයිබර් තර්ජනයන්ට මුහුණ දීමේ හැකියාව පාලනයේ සහ රාජ්‍ය සේවා සැපයීමේ අත්‍යවශ්‍ය කුළුණක් ලෙස හඳුනා ගන්නා ලදී.

Sri Lanka CERT ආයතනයේ තොරතුරු ආරක්ෂණ කළමනාකරු සේනාලික දේවාලවත්ත මහතා අනිෂ්ට මෘදුකාංග විශ්ලේෂණය සහ තර්ජනවලට මුහුණ දීම පිළිබඳව (MATH Lab) කරුණු ඉදිරිපත් කළ අතර, ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරී මහින්ද කන්දපහල මහතා NCSOC පිළිබඳව කරුණු දැක්වීය. NCSOC සිදුවීම් හසුරුවන්නා වන විමුක්ති පෙරේරා මහතා ගැටළු කළමනාකරණය කරන ආකාරය පිළිබඳව කරුණු දැක්වීය.

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් චමින්ද හෙට්ටිආරච්චි මහතා, අග්‍රාමාත්‍ය කාර්යාලයේ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ ජී.වී.ඩී. ප්‍රියන්ත මහතා, සහ ICTA හි ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු අරවින්ද රත්නායක මහතා තම ආයතන ජාතික SOC හා සම්බන්ධ කිරීමේ අත්දැකීම් බෙදා ගත්හ.

සැසියේදී, Sri Lanka CERT හි සභාපති තිලක් පතිරගේ මහතා සහ Sri Lanka CERT හි වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය කණිෂ්ක කරුණාසේන මහතා විසින් ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී. Sri Lanka CERT ආයතනයේ කාර්ය මණ්ඩල සාමාජිකයින්, රජයේ තීරණාත්මක සංවිධානවල ප්‍රධානීන් සහ ජ්‍යෙෂ්ඨ නියෝජිතයින් සමඟ සාකච්ඡාවට සහභාගී විය.

## ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ ලේකම් ලෙස වරුණ ශ්‍රී ධනපාල මහතා පත් කෙරේ

ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා විසින් පෙබරවාරි මාසයේදී ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස වරුණ ශ්‍රී ධනපාල මහතා පත් කරන ලදී.

ජනාධිපති ලේකම් ආචාර්ය නන්දික සනත් කුමානායක මහතා විසින් ජනාධිපති ලේකම් කාර්යාලයේදී පත්වීම් ලිපිය ප්‍රදානය කරන ලදී.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන ධනපාල මහතා, විධිමත් පත්වීමට පෙර ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ වැඩබලන ලේකම් ලෙස සේවය කරන ලදී.



## ප්‍රධාන බැංකුවලින් අවවාදාත්මක පණිවිඩයක්

වංචාකරුවන් විසින් පිටරට රැකියා අවස්ථා ලබාදීම්, ත්‍යාග, ලොතරැයි දිනුම් ඇදීම් හෝ සමාජ මාධ්‍ය පණිවිඩ ඔස්සේ ඔබගේ පුද්ගලික තොරතුරු ලබා ගැනීමට උත්සාහ කරමින් සිටී. සැමවිටම OTP අංකය ඇතුලත් කිරීමට SMS පණිවිඩයේ අදාළ ගනුදෙනුව කුමක්ද යන්න කියවා බලන්න.

ඔබගේ ගිණුමට මුදල් ලබා ගැනීම සඳහා කිසිදුවිටක OTP අංකය අවශ්‍ය නොවේ. ඔබ අන්තර්ජාලය ඔස්සේ ගිණුම්වලට පිවිසෙන්නේ නම් සෑම විටම බැංකු නිල වෙබ් අඩවිය ඔස්සේ පමණක් ගිණුමට පිවිසීමට වගබලා ගන්න.

## ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය

Sri Lanka CERT ආයතනයේ ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය (NCSOC) මෙරට තීරණාත්මක ඩිජිටල් යටිතල පහසුකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධානතම මධ්‍යස්ථානය ලෙස සේවය කරයි.

පැය 24 පුරාම ක්‍රියාත්මක වන ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය, තීරණාත්මක ජාතික තොරතුරු යටිතල පහසුකම් සහ ප්‍රධාන රාජ්‍ය අංශ ආරක්ෂා කිරීම සඳහා අඛණ්ඩ සයිබර් තර්ජන නිරීක්ෂණය, සිදුවීම් හඳුනාගැනීම සහ වේගවත් සයිබර් ප්‍රතිචාර දැක්වීම සපයයි. දියුණු ආරක්ෂක තාක්ෂණයන්ගෙන් සමන්විත මෙම මධ්‍යස්ථානය, ක්‍රියාකාරී තර්ජන හඳුනාගැනීම, ආරක්ෂක සිදුවීම් සහසම්බන්ධතාවය සහ පරිණාමය වන සයිබර් තර්ජනවලට එරෙහිව සම්බන්ධීකරණ සිදුවීම් ප්‍රතිචාර දැක්වීම සක්‍රීය කරයි. NCSOC විසින් සයිබර් තර්ජන බුද්ධිය නිෂ්පාදනය කර බෙදා හරින අතර, ආයතනයන්ට සයිබර් අවදානම් අපේක්ෂා කිරීමට, වැළැක්වීමට සහ අවම කිරීමට උපකාර කිරීම සඳහා ක්‍රියාකාරී අවබෝධයන්, පූර්ව අනතුරු ඇඟවීම් සහ තර්ජන උපදේශන සපයයි.

සහතිකලත් සයිබර් ආරක්ෂණ වෘත්තිකයන් කණ්ඩායමකින් සහ වසර ගණනාවක මෙහෙයුම් විශේෂඥතාවයකින් යුත් ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය, ජාතික සයිබර් ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලංකාවේ ඩිජිටල් පරිසර පද්ධතිය කෙරෙහි විශ්වාසය පවත්වා ගැනීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

# ලිංගික ක්‍රියාකාරකම් අන්තර්ජාලයට එක් කිරීමෙන් සිදුවන අවදානම!

ඔබගේ ලිංගික ක්‍රියාකාරකම්වල දර්ශන අන්තර්ජාලයට එක් කිරීමෙන් වැලකීමට ප්‍රවේශම් විය යුත්තේ දශක කිහිපයකට පසුව වුවද ඒවා ඔබට හානි කර විය හැකි නිසාවෙනි.  පහත දැක්වෙන මේ කතාව ඊට හොඳම නිදසුනකි.

කාන්තාවකට තමන්ගේ ලිංගික දර්ශන ඇතුලත් වීඩියෝවක් අන්තර්ජාලයෙන් ඉවත් කර ගැනීමට අවශ්‍යව තිබුණි.  තම පළමු විවාහයේ සැමියා සමග ඇය ලිංගිකව එක් වූ අවස්ථාවක් එම දර්ශනවලට ඇතුලත්ව තිබුණි. එම වීඩියෝව අන්තර්ජාලයට එක් කර තිබුනේ හරියටම වසර 20 කට පමණ පෙරාතුවය. ඒ වනවිට තරුණ වයසේ පසුවීමත් අත්දැකීම් අඩුකමත් හේතුවෙන් එම වීඩියෝව තම සැමියා විසින් අන්තර්ජාලයට එක් කරනවාට ඇය විරුද්ධ වී තිබුනේ නැත.



කෙසේවෙතත් වසර කිහිපයකට පසු පළමු විවාහයෙන් දික්කසාද වීමට ඇයට සිදුව තිබුණි. එම විවාහයේ දරුවන්ගේ භාරකාරත්වය පැවරුනේද ඇයටමය. ඇය නැවත විවාහ වී ඇති බව දැනගත් පළමු විවාහයේ සැමියා එම වීඩියෝ දර්ශන නැවත Share කිරීමට පියවර ගෙන තිබුණි. එම දර්ශන දුටු වහාම ඇයට එම වීඩියෝව අන්තර්ජාලයෙන් ඉවත් කර ගැනීමට අවශ්‍ය වූයේ තම දරුවන් දෙදෙනා දැකීමට පෙර එම වීඩියෝව ඉවත් කර ගැනීමටය.

නමුත් ඒ වනවිට සිදුවිය හැකි හානිය සිදුව හමාරය. සිදු කල සොයා බැලීමේදී එම වීඩියෝව වෙබ් අඩවි අසූවක පමණ හුවමාරුවී  පලවී තිබෙන ආකාරය සොයා ගත හැකි විය. මේ සම්බන්ධයෙන් Sri Lanka CERT ආයතනය මහජනතාවට ලබාදෙන උපදේශය නම්, ඔබගේ ලිංගික දර්ශන පමණක් නොව අතිශයින්ම පුද්ගලික කිසිදු තොරතුරුක් අන්තර්ජාලය ඔස්සේ බෙදා හුවමාරු කරගැනීමෙන් වැලකීමට සැලකිලිමත්වන ලෙසයි.

# පොලිස් නිලධාරීන් 200කට සයිබර් ආරක්ෂාව පිළිබඳව විශේෂ පුහුණුවක්

ශ්‍රී ලංකා පොලිස් සේවයේ නිලධාරීන් 200කට ආසන්න පිරිසක් සඳහා සයිබර් ආරක්ෂාව පිළිබඳව විශේෂ වැඩමුළු කිහිපයක් මධ්‍යම පළාත තුල පැවැත්වීමට Sri Lanka CERT ආයතනය පසුගියදා කටයුතු කරන ලදී.

Sri Lanka CERT ආයතනය සහ ශ්‍රී ලංකා පොලීසිය එක්ව දිවයින පුරා පිහිටි පොලිස් කොට්ඨාස නියෝජනය කරනු ලබන පොලිස් නිලධාරීන් සඳහා මෙම පුහුණු වැඩමුළු පැවැත්වීමට කටයුතු යොදා ඇත. පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතාගේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා පොලිසියේ තොරතුරු තාක්ෂණ කොට්ඨාසය බාර නියෝජ්‍ය පොලිස්පතිතුමියගේ අධීක්ශණය යටතේ වැඩසටහන් සංවිධානය කරනු ලැබේ.

මධ්‍යම පළාතේ මහනුවර, ගම්පොළ, මාතලේ සහ තෙල්දෙණිය යන පොලිස් කොට්ඨාස නියෝජනය කරනු ලබන පොලිස් නිලධාරීන් එම පුහුණුවට එක්ව සිටියහ.

මධ්‍යම පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩමුළුවලදී Sri Lanka CERT ආයතනයේ සයිබර් ආරක්ෂාව පිළිබඳ පුහුණු කළමනාකරු තිළිණ දිසානායක සහ තොරතුරු ආරක්ශණ ඉංජිනේරු ශෙහාන් සංජුල විසින් සැසිවාරයන් මෙහෙයවූහ.





